**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2017**

---

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තියේ හා 1 උප වගන්තිය අනුව සහ 1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
---------------

### 2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

ජපන් රජයෙන් පරිත්‍යාගයක් ලෙස පෞද්ගලික ආයතනයකට ලද පානීය ජලය පිරිසිදු කිරීම සඳහා වන උපකරණ හයක් වරායෙන් නිදහස් කිරීමේ ගාස්තුව වූ රු. 359,248 ක් අමාත්‍යාංශයේ උපදෙස් මත මධ්‍යස්ථානය විසින් දරා තිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පර්යේෂණ ප්‍රවලිත කිරීමේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් නිමකර භාරදී තිබූ වාණිජ ව්‍යාපෘති 04 ක දෝෂ ආවරණ කාලය 2018 ජූලි විගණන දින වනවිට අවසන් වී තිබුණද, රු.482,122 ක් වූ රඳවාගත් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් නිමකර තිබූ ව්‍යාපෘති 04 කට අදාලව මාස 24 සිට මාස 18 ක කාලයක සිට පැවත එන ලැබිය යුතු රු.970,622 ක මුදලක් 2018 ඔක්තෝබර් වනවිටත් අයකරගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,129,045 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,182,265 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.946,780 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු. 28,014,850 කින් හා විලම්භිත ආදායම රු. 3,985,412 කින් වැඩි වුවද, පරිපාලන වියදම් රු. 19,539,409 කින් වැඩිවීම, වෙනත් වියදම් රු. 6,338,438 කින් වැඩිවීම, ක්ෂය වීම් රු. 2,875,302 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු. 4,241,487 කින් අඩුවීම මෙම ඌනතාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේදී රු. 28,114,860 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට රු.2,238,655 ක් දක්වා අඩුවී තිබුණ ද, 2017 වර්ෂයේ දී එය රු. 5,129,045 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු. 191,433,742 ක් වූ මධ්‍යස්ථානයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු. 272,949,075 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වියදම් පිරිමැසුම්දායක ගොඩනැඟිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් හා පුහුණු වැඩසටහන් 3 ක් පවත්වා තිබුණු අතර ඊට 253 දෙනෙකු සහභාගී වී තිබුණි. 14 දෙනෙකු සඳහා මෙම තාක්ෂණය පැවරීමට අපේක්ෂා කලද, අදාල තාක්ෂණය ලබා ගැනීම පිළිබඳ අවධානය යොමුකර තිබුනේ පුද්ගලයින් 3 දෙනෙකුට පමණි. මේ අනුව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මධ්‍යස්ථානය හඳුන්වා දුන් තාක්ෂණයන් 21 කින් බලපත්‍ර 55 ක් ලබා දීමට ඉලක්ක කර තිබුණ ද ලබා දීමට හැකි වී තිබුණේ තාක්ෂණයන් 9 කින් බලපත්‍ර 23 ක් පමණි. එම තාක්ෂණයන්ගෙන් තාක්ෂණයන් 8 ක්ම 2008-2012 කාලයන්හි දී මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙන ලද තාක්ෂණයන් වූ අතර 2013-2017 කාල පරිච්ඡේදයේදී හඳුන්වා දී තිබූ තාක්ෂණයන් ප්‍රචලිත වී නොතිබුණි.

(ඇ) 2013-2017 කාලයට අදාලව මධ්‍යස්ථානය විසින් තාක්ෂණ හා  තාක්ෂණ උපකරණ 20 ක් හඳුන්වා දී තිබුණු අතර ඒ සඳහා රු. 14,992,213 ක පිරිවැයක් දරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තාක්ෂණ පැවරීම් (Technology Transfers) සිදු කිරීමට හැකි වී තිබුණේ පිරිවැය රු. 312,102 ක් වූ තාක්ෂණයන් 2ක් සඳහා පමණි. හඳුන්වා දී තිබූ අනෙකුත් තාක්ෂණයන් 18 න් කිසිවක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සමාජගත වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල බලපත්‍ර 100ක් අළුත් කිරීමට ඉලක්ක කර තිබුණ ද, අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 46 කි. හඳුන්වාදීමට බලාපොරොත්තු වූ තාක්ෂණයන් පිළිබඳව ව්‍යවසායකයින්ගේ උනන්දුවක් නොමැති බැවින් ඉලක්කගත මට්ටමට නව බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම සිදු කළ නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මධ්‍යස්ථානයේ තාක්ෂණයන් පිළිබඳව මහජනයා අතර විශ්වාසය තහවුරු කිරීමත්, හඳුන්වා දුන් තාක්ෂණයන්හි යල් පැනීම් සිදුවීම වැළැක්වීමේ පියවර ගැනීමත්, ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීමත් පිළිබඳ මධ්‍යස්ථානය අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) 2013-2017 කාලපරිච්ඡේදයේදී මධ්‍යස්ථානය විසින් තාක්ෂණයන් 20 ක් හඳුන්වා දී තිබුණද පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම්කර තිබුණේ තාක්ෂණයන් හතරක් සඳහා පමණක් බව නිරීක්ෂණය විය.

(ඊ) දකුණු පළාත් සභාවේ ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය සඳහා වැව්වල ජලජ පැළෑටි කපා ඉවත් කිරීමේ යන්ත්‍රයක් නිපදවීමේ ව්‍යාපෘතියක් 2016 ජූනි 21 දින ආරම්භකර තිබුණු අතර එය 2016 සැප්තැම්බර් 09 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. අමාත්‍යාංශය විසින් වරින්වර මෙම යන්ත්‍රයේ දැඩි අවශ්‍යතාවය දක්වමින් පර්යේෂණ කටයුතු කඩිනම් කර යන්ත්‍රය නිපදවීමට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන ලෙස ඉල්ලා තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 3 කදී දින දීර්ඝ කර තිබුණත් යන්ත්‍රය නිපදවීමේ කටයුත්ත නිමකර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.368,364 ක පිරිවැයක් දරා තිබුණි.

(උ) ස්වයංක්‍රීය යෝගට් පිරවීමේ සහ මුද්‍රා තැබීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් 2017 පෙබරවාරි 01 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.560,000 ක් විය. අදාල කාලය තුල නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2018 පෙබරවාරි 28 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් 2018 ජූලි විගණන දින වන විට රු. 576,247 ක පිරිවැයක් දරා තිබුණ ද මෙම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

(ඌ) පොල් කුඩු භාවිතයෙන් ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු තෙල් ලබා ගැනීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර කොරියාවෙන් ආනයනය කළ යන්ත්‍රයක් අනුව ආදර්ශ යන්ත්‍රයක් නිපදවා එය පරීක්ෂාකර වැඩි දියුණු කර අවසානයේ එවැනි යන්ත්‍ර 4 ක් නිපදවීම මධ්‍යස්ථානයේ කාර්යභාරය විය. ආදර්ශ යන්ත්‍රය හා තවත් එක් යන්ත්‍රයක් නිපදවීම සඳහා රු. 2,240,104 ක් වැයකර තිබුණු අතර මෙම යන්ත්‍රය සම්බන්ධව උෂ්ණත්ව පාලන පද්ධතියෙහි ගැටළු පවතින බවත්, අමුද්‍රව්‍ය නිසි ලෙස ඇතුලත සිට පිටතට නොපැමිණෙන බවත් හඳුනාගෙන තිබුණද ඒ සඳහා සුදුසු පිළියම් යොදා නොතිබුණි. ව්‍යාපෘතියට අදාලව යන්ත්‍ර 4 ක් නිපදවිය යුතු වුවත් එක් යන්ත්‍රයක් පමණක් නිපදවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු කරා ලඟා වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී නිමකරන ලද පිරිවැය රු.313,572 ක් වූ ව්‍යාපෘති 2ක් පර්යේෂණ අවස්ථාවේදී හඳුනාගත් අඩුපාඩු හේතුවෙන් අසාර්ථක වී තිබුණු අතර එම අඩුපාඩු මඟහැර ගැනීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රමයක් යොදා ගෙන ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝ අවස්ථාවලදී අපේක්ෂිත කාලය තුලදී අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාව අනුව 2014-2016 කාල පරිච්ඡේදයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 20 ක් මාස 2 සිට මාස 24 දක්වා කාලයකින් නිම කිරීමට සැලසුම් කර තිබුණද අදාල කාල සීමාව තුළ නිම කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මාස 6 සිට මාස 31 දක්වා කාලයන්ගෙන් දින දීර්ඝ කිරීම් සිදු කර තිබුණි. සැලසුම් කිරීමේ අඩුපාඩු පැවතීම, බාහිර පාර්ශවයන් සමඟ විධිමත් පරිදි ගිවිසුම්වලට නොඑළඹීම හා ව්‍යාපෘති කර ගෙන යැමේදී දෙපාර්ශවය අතර සිදු වන නොඑකඟතාවයන් හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබුණි.

(ඇ) අත් යන්ත්‍ර කර්මාන්තය සඳහා අවශ්‍ය රෙදිපිළි පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් නිපදවීමේ ව්‍යාපෘතියක් 2015 දෙසැම්බර් 8 දින ආරම්භ කර තිබුණු අතර එහි පළමු අදියර ලෙස රු.840,950 ක් වටිනා යන්ත්‍රයක් නිපදවා 2016 දෙසැම්බර් 23 දින කර්මාන්ත දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. යන්ත්‍රයේ වරින් වර ඇති වූ ගැටළු පිළිබඳව 2018 ජූලි විගණිත දිනය වන විට අවස්ථා 6 ක දී කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයට වාර්තා කර තිබුණු නමුත් යන්ත්‍රය ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට පත් කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව II අදියරේදී මෙම යන්ත්‍රය සඳහා වැඩි දියුණු කිරීම් සිදු කිරීමට අපේක්ෂා කලද එය ඉටු කරගත නොහැකි වී තිබුණි.

(ඇ) කුරුණෑගල මහ නගර සභාව සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.5,690,000 ක් වූ උසස් තාක්ෂණයන් සහිත නව ආදාහනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් 2016 පෙබරවාරි 05 දින ආරම්භ කර 2018 මාර්තු 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ව්‍යාපෘති කාලය 2018 සැප්තැම්බර් 30 දක්වා දින දීර්ඝ කොට තිබුණි. එදිනට රු. 4,766,748 ක් මේ සඳහා වැය කර තිබුණ ද ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

(ඉ) ගාල්ල වග්ගල් මෝදර හා බෙන්තර වී පර්යේෂණ ආයතනයේ ඇල ඔස්සේ ලවන ජලය ගොඩබිමට ඒම පාලනය කිරීම සඳහා මධ්‍යස්ථානය කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2014 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. 2018 ජුලි විගණන දින වන විට ව්‍යාපෘති දෙක වෙනුවෙන් රු. 218,108 ක් වැය කර තිබුණු නමුත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. දෙපාර්ශවය අතර නොඑකඟතාවයන් පැවතීමත්, විධිමත් ගිවිසුම්වලට නොඑළඹීමත් හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වී තිබුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

------------------------

2015 - 2017 කාලයේදී නිමකරන ලද වාණිජ ව්‍යාපෘති 10 කින් ආදායමට වැඩි වියදමක් දැරීමට සිදුවීම හේතුවෙන් රු. 2,771,188 ක අලාභයක් සිදු වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

--------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

------------------------------------------------

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණි.

(ආ) ඉහත පරිදි දැනුවත් වී තිබුණද තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයන් හෝ භෞතික පහසුකම්වල අවශ්‍යතාවයන් හඳුනා ගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

**6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි එක් එක් අදියර සඳහා කාලයන් නිරූපණය වන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් අඩු වියදම් ඉදිකිරීම් තාක්ෂණයන් හඳුන්වා දී තිබියදී කාර්යාලයේ ඉදිරිපස පරිශ්‍රය නවීකරණය කිරීමේ (Rehabilitation of Front Office Building) කොන්ත්‍රාත්තුව රු. 7,868,607 ක කොන්ත්‍රාත් වටිනාකමකට බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) සේවක මණ්ඩල කළමනාකරණය | | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමේදී ප්‍රමාදයන් පැවතීම |
| (ආ) ප්‍රසම්පාදන කළමනාකරණය | (i) | භාණ්ඩ මධ්‍යස්ථානයට ලැබුණු පසු කාර්යසාධන ඇපකර ලබා ගැනීම |
| | (ii) | ගෙවීම් අනුමත කිරීමට පෙර භාණ්ඩ නිසි පරිදි ක්‍රියාත්මක වන බවට නිර්දේශයක් ලබා නොගැනීම |
| | (iii) | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා දින රහිතව ලබා දී තිබීම |
| | (iv) | ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් නොවූ භාණ්ඩ මිලදී ගත් අවස්ථා පැවතීම |
| | (v) | ඇස්තමේන්තුගත පිරිවැය හා තත්‍ය පිරිවැය අතර විශාල විචලනයන් පැවතීම |
| | (vi) | භාණ්ඩ ඇණවුම් කළ පසු භාණ්ඩ සැපයීම සඳහා දීර්ඝ කාලයක් ගතවූ අවස්ථා පැවතීම |
| | (vii) | ලංසු විවෘත කිරීමේ දී, ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාවල සියලුම සාමාජිකයන් අත්සන් යොදා නොතිබූ අවස්ථා පැවතීම |
| (ඇ) බඳවා ගැනීම් හා උසස් කිරීම් | (i) | පුරප්පාඩු පිරවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණද බඳවා ගැනීමට කටයුතු නොකිරීම |
| | (ii) | සම්මුඛ පරීක්ෂණ ලේඛනවල සියලුම නිලධාරීන් අත්සන් යොදා නොමැති අවස්ථා පැවතීම |
| (ඈ) ව්‍යාපෘති කළමනාකරණය | (i) | ව්‍යාපෘති කාලය දීර්ඝ කරන අවස්ථාවන්හිදී ඒ සඳහා හේතු දක්වා නොමැති අවස්ථා පැවතීම |
| | (ii) | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථමව විධිමත් ගිවිසුම්වලට එළඹ නොමැති අවස්ථා පැවතීම |